# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## මධ්‍ය වාර්ෂික පරීක්ෂණය - 2018

| II ශ්‍රේණිය | භූගෝල් විද්‍යාව | II පත්‍රය | කාලය පැය 2 යි |
|---|---|---|---|

**නම :-** ........................................................................................................................

**සැළකිය යුතුයි.**

**01.** **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් 02 කි.**

**02.** **I කොටස අනිවාර්යය වේ. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.**

### I කොටස

01. අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති අංක 01 කඩදාසිය යොදා ගන්න.

**අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

i. සිතියමේ A B යන ස්ථානවල දැකිය හැකි භූවිෂමතා ලක්ෂණය කුමක්ද? **(ලකුණු 01 යි)**
(තැනිතලා / රළිබිම් / උස් බිම්)

ii. සිතියම්ගත ප්‍රදේශයේ දැකිය හැකි ප්‍රධානතම ජලවහන ලක්ෂණය කුමක්ද? **(ලකුණු 01 යි)**
(වැව / වගුරු බිම / පාළු අත්හරින ලද වැව)

iii. C සිට D දක්වා විහිදෙන පරිපාලන මායිම කුමක්ද? **(ලකුණු 01 යි)**
(නගර සභා සීමා / ග්‍රාම සේවා නිළධාරී කොට්ඨාස මායිම / උප දිසාපති කොට්ඨාස මායිම)

iv. ප්‍රදේශයේ බහුලව ව්‍යාප්තව ඇති බෝගය කුමක්ද? **(ලකුණු 01 යි)**
(වී / වගුරු බිම් / ලඳු කැලෑ)

v. සිතියමේ කහ පාට වර්ණයෙන් දක්වා ඇති මාර්ගය වන්නේ, **(ලකුණු 01 යි)**
(කරත්ත පාර / අඩිපාර / සෙසු මාර්ග)

vi. ප්‍රදේශයේ දැකිය හැකි ප්‍රධාන ආගම කුමක්ද? **(ලකුණු 01 යි)**

vii. සිතියම් ප්‍රදේශයේ උතුරු - දකුණු දිශානුගතව විහිදෙන ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර් වලින් දක්වන්න. **(ලකුණු 01 යි)**


viii. ප්‍රදේශයේ වැසියන්ගේ ප්‍රධාන ආර්ථික කටයුත්තක් දක්වන්න. **(ලකුණු 01 යි)**

ix. සිතියමේ කොටුකර දක්වා ඇති ප්‍රදේශයේ දක්නට ලැබෙන රාජ්‍ය ආයතනයක් නම් කරන්න. **(ලකුණු 01 යි)**

x. බෝග වගාව හැරුණු විට ප්‍රදේශයේ වැසියන්ට කළ හැකි වෙනත් ආර්ථික කටයුත්තක් දක්වන්න. **(ලකුණු 01 යි)**

**(ලකුණු 10 යි)**

ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා අංක 01 කඩදාසිය යොදා ගන්න.




i. සිතියමෙහි A, B හා C යන අක්ෂරවලින් දක්වා ඇති ඇළ මාර්ග අතරින් මධ්‍යධරණී හා රතු යන මුහුදු සම්බන්ධ කරන **සූවස් ඇළ** දක්වා ඇත්තේ කිනම් අක්ෂරයෙන්ද?

ii. සිතියමෙහි D, E හා F වලින් දක්වා ඇති දූපත් අතරින් පළතුරු වගාවට ප්‍රසිද්ධ **සයිප්‍රස් දූපත** දක්වෙන අක්ෂරය කුමක්ද?


iii. සිතියමෙහි G,H,J යන අක්ෂරවලින් ලෝකයේ ප්‍රධාන වනාන්තර කිහිපයක් දක්වේ. ඒ අතරින් කොංගො වනාන්තරය දක්වෙන රට කුමක්ද?

iv. සිතියමෙහි K,L,M යන අක්ෂර වලින් දක්වා ඇති රටල් අතරින් ''විල් දහසේ රට'' යන විරුදාවලියෙන් හඳුන් වන **පින්ලන්තය** දක්වෙන අක්ෂරය කුමක්ද?

v. සිතියමෙහි P,Q,R යන අක්ෂර වලින් ලෝකයෝ විශාලතම සාගරය වන පැසිපික් සාගරය දක්වෙන අක්ෂරය කුමක්ද?

**(ලකුණු 05 යි)**

ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා අංක 02 කඩදාසිය යොදා ගන්න.




i. සිතියමෙහි A,B හා C වලින් දක්වා ඇති ස්ථාන අතරින් **අම්බලන්තොට වී පර්යේෂණායතනය** දක්වෙන අක්ෂරය කුමක්ද?

ii. සිතියමෙහි D,E,F වලින් දක්වෙන ගංගා අතරින් **වලවේ ගංගාව** දක්වෙන අක්ෂරය කුමක්ද?

iii. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනක් G,H, හා J වලින් දක්වේ. ඒවා අතරින් පොල් ත්‍රිකෝණයට අයත් **පුත්තලම දිස්ත්‍රික්කය** දක්වෙන අක්ෂරය කුමක්ද?


iv. සිතියමෙහි K,L,M වලින් දක්වෙන වන රක්ෂිත අතරින් දඩි ස්වාභාවික රක්ෂිතයක් වන **හග්ගල රක්ෂිතය** දක්වෙන අක්ෂරය කුමක්ද?

v. සිතියෙමහි P,Q,R වලින් දැක්වෙන ස්ථාන අතරින් බෞද්ධ, කතෝලික, ඉස්ලාම් යන ආගමික බැතිමතුන්ගේ වන්දනාමානයට පාත්‍රවන **සමනළ කඳු මුදුන** දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන්ද?

**(ලකුණු 05 යි)**

## II කොටස

02. ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප දක්වෙන රූප සටහනක් යාබදව දැක්වේ. එය හොඳින් අධ්‍යනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. රූප සටහනෙහි A හා B අක්ෂරවලින් දක්වා ඇති දේශගුණික කලාප දෙක මොනවාදැයි පිළිවෙලින් නම් කරන්න.

**(ලකුණු 02යි)**

ii. a. ඔබ ඉහත i හි නම් කළ දේශගුණික කලාපයක විශේෂ ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

b. ලෝක දේශගුණික වර්ගීකරණ ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයෙකු නම් කරන්න.

**(ලකුණු 03 යි)**

iii. දේශගුණය ලෝකයේ මිනිස් කටයුතු කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් තුනක් දක්වමින් විස්තර කරන්න. **(ලකුණු 05 යි)**

03. i. පහත දැක්වෙන එක් එක් වගාවට අදාළ ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇති ස්ථානය නම් කරන්න.

A - පොල්

B - සුළු අපනයන බෝග

**(ලකුණු 02 යි)**

ii. පොල් වගාව ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත් වන ආකාරය කරුණු තුනකින් දක්වන්න. **(ලකුණු 03 යි)**

iii. සුළු අපනයන බෝග වගාව ප්‍රවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 02ක් පැහැදිලි කරන්න.

**(ලකුණු 05 යි)**

04. i. ලොක්යේ දක්නට ලැබෙන විශාලතම නිවර්තන වර්ෂා වනාන්තර 02ක් නම් කරන්න. **(ලකුණු 02යි)**

ii. නිවර්තන වර්ෂා වනාන්තරවල විශේෂ ලක්ෂණ 03ක් සඳහන් කරන්න. **(ලකුණු 03 යි)**

iii. a. ස්වභාවික සම්පතක් වූ වනාන්තර විනාශවීම නිසා ලෝකයට අත්විය හැකි අහිතකර ප්‍රතිඵල 02ක් සඳහන් කරන්න.

**(ලකුණු 02 යි)**

b. වනාන්තර සංරක්ෂණයට ගත හැකි පියවර 02ක් සඳහන් කර ඉන් 01ක් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03)**

05. i. ශ්‍රී ලංකාවේ බලශක්තිය නිපදවීම සඳහා යොදා ගන්නා ශක්ති උත්පාදක 02ක් නම් කරන්න.

**(ලකුණු 02යි)**

ii. ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා කරන ද්‍රව ඉන්ධන වර්ග 03ක් නම් කරන්න.

**(ලකුණු 03 යි)**

iii. බලශක්ති සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමෙන් රටකට ලබාගත හැකි වාසි 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 05 යි)**

06. i. ජන සංඛ්‍යා ව්‍යාප්තිය අනුව ශ්‍රී ලංකාවේ අඩුම හා වැඩිම ජන සංඛ්‍යාවක් ව්‍යාප්තව සිටින දිස්ත්‍රික්ක 02 නම් කරන්න.

**(ලකුණු 02යි)**

ii. a. ''ජන සංඛ්‍යාව වියපත්වීම'' ලෙස හඳුන්වන්නේ කුමක්ද?

**(ලකුණු 02යි)**

b. මෙම ගැටලුවට වර්තමානයේදී මුහුණ දෙන රටක් නම් කරන්න. (ශ්‍රී ලංකාව හැර)

**(ලකුණු 01)**

iii. ජන සංඛ්‍යාව වියපත්වීම ආශ්‍රිතව රටකට මුහුණ පෑමට සිදුවන ගැටලු 03ක් ලියා ඉන් දෙකක් විස්තර කරන්න.

**(ලකුණු 05 යි)**

07. i. සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන නූතන මිනුම් ක්‍රම 02ක් නම් කරන්න.

**(ලකුණු 02යි)**

ii. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනයට මෑතකාලීනව ගෙන ඇති පියවර 03ක් දක්වන්න.

**(ලකුණු 03 යි)**

iii. a. තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා ඇති මූලාශ්‍ර 03ක් සඳහන් කරන්න.

**(ලකුණු 03යි)**

b. අන්තර්ජාල සම්බන්ධතාවලින් ලැබිය හැකි වාසි 02ක් සඳහන් කරන්න.

**(ලකුණු 02)**

08. i. පැන්සල් කූරු සහ වීදුරු සඳහා භාවිතා වන අමුද්‍රව්‍ය පිළිවෙලින් නම් කරන්න.

**(ලකුණු 02යි)**

ii. a. ඉල්මනයිට්

b. සර්කෝන්

c. රූටයිල් යන ඛනිජ වර්ග ව්‍යාප්ත ප්‍රදේශ එක බැගින් ලියන්න. **(ලකුණු 03)**

iii. ඛනිජ සම්පත් භාවිතයේදී මුහුණපාන ගැටලු 02ක් හා සංරක්ෂණය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 03ක් ලියන්න. **(ලකුණු 05 යි)**

**(මුළු ලකුණු 60 යි)**